**රේගු නිලධාරීන්ගේ  ත්‍යාග අරමුදල - 2016**

**---------------------------------------------------------**

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 2.1 අහිතකර මතය

---------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පිළියෙල කර ඇති බව වාර්තා කර තිබුණද, ප්‍රමිතියට පටහැනි ලෙස නිලධාරීන් විසින් පනවන ලද දණ්ඩන හා රාජසන්තක කිරීම් මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි.

(ආ) මෙම ප්‍රමිතියේ 21 ඡේදය ප්‍රකාරව අස්තිත්වයක අනුමත කළ අයවැය ලේඛනයක් නිකුත් කර ඇත්නම් අයවැය ගත සංඛ්‍යා වෙනම මූල්‍ය ප්‍රකාශනයක් වශයෙන් හෝ තත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් ලෙස වෙනම තීරුවක දැක්විය යුතු විය. එහෙත් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුල අයවැයගත තොරතුරු අනාවරණය කර නොතිබුණි.

(ඇ) විමර්ශන කටයුතු අවසන් වුවද, ත්‍යාග ලිපිගොනු ගිණුම් අංශය වෙත නොලැබුණු සහ විමර්ශන කටයුතු තවදුරටත් සිදු වෙමින් පවතින විමර්ශන ලිපිගොනුවලට අදාල කිසිදු තොරතුරක් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

අරමුදලේ ආදායම ලෙස රේගු දණ්ඩන හා රාජසන්තක කළ භාණ්ඩ විකුණුම් ආදායමින් සියයට 50 ක කොටසක් හඳුනාගනු ලැබුවද, එම ආදායම හඳුනාගනු ලබන්නේ රේගු විමර්ශන නිමකල අවස්ථාවේද, දණ්ඩන මුදල් ගෙවා නිමවූ අවස්ථාවේද හෝ දණ්ඩන මුදල් නිලධාරීන් අතර බෙදා හල අවස්ථාවේදීද යන්න කළමනාකරණය විසින් තීරණය කර නොතිබූ අතර අදාල ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර හෝ නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ත්‍යාග අරමුදල සඳහා ලැබෙන මුළු ආදායම උප අරමුදල් 05 ක් සඳහා බෙදා වෙන් කරනු ලබන අතර මෙසේ වෙන් කරනු ලබන අවස්ථාවේදී සිදුවූ ගණනය කිරීමේ වැරදි හේතුවෙන් එක් උප අරමුදලක් වන "සියයට 2.5 " අරමුදල රු.200,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට විමර්ශන කටයුතු අවසන්ව තිබූ සිද්ධි ලිපිගොනු 81 කට අදාලව පනවා තිබූ දණ්ඩන මුදල වූ රු.1,597,390,932 මුදලින් අයකර ගෙන තිබුණේ රු.436,806,066 ක් පමණි. පනවන ලද දණ්ඩන මුදලින් අරමුදලට දායක වන සියයට 50 ක් වූ රු.798,695,466 ක ආදායම්, රු.218,403,033 ක් වූ අයවූ මුදල හා තවදුරටත් අයවිය යුතුව තිබූ රු.580,292,433 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රේගු දණ්ඩන හා රාජසන්තක කරන ලද භාණ්ඩ විකුණුම් ආදායමින්, සියයට 50 ක දායකයක් ත්‍යාග අරමුදලටද තවත් සියයට 20 ක් කළමනාකරණ වන්දි අරමුදලට හා ඉතිරි සියයට 30 ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණද, අරමුදලේ ආදායම් හඳුනාගනු ලබන්නේ, ගිණුම් අංශයෙන් ත්‍යාග ගෙවීම් සිදු කරනු ලබන අවස්ථාවේදී බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව කළමනාකරණ වන්දි අරමුදල සඳහා ආදායම් ලෙස හඳුනාගෙන තිබූ රු.20,479,241 කට සමානුපාතිකව ත්‍යාග අරමුදලට ආදායම් ලෙස හඳුනාගත යුතු රු.51,198,102 ක් වූ ආදායම් හඳුනාගෙන නොතිබුණි.

**2.2.4 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අඩුපාඩු**

---

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදම ඉක්මවූ ආදායම රු.164,425,880 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, මෙය වියදම් ඉක්මවූ අතිරික්තයක් නොවන අතර මෙහි සංයුතිය වී තිබුණේ ත්‍යාග අරමුදලේ උප අරමුදල් වන ඉන්ධන අරමුදල සඳහා වෙන්කල රු.67,333,645 ක්, සියයට 2.5 අරමුදල සඳහා වෙන්කල රු.33,826,973 ක්, විෂමත්ද්‍රව්‍ය අරමුදල සඳහා වෙන්කල රු.23,558,781 ක් හා සංචිත නිලධාරීන්ට ගෙවීම් සඳහා වෙන්කල රු.39,706,481 කි.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

---

2016 දෙසැම්බර් 31 දින වන විට නිලධාරීන් වෙත ලබා දීමට තිබූ එකතුව රු.993,492,865 ක් වූ ත්‍යාග මුදල්, වර්ෂ ගණනාවක සිට සමුච්චිතව පැවති ඒවා වුවද මෙම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.164,425,880 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.32,476,907 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.131,948,973 කින් හෙවත් සියයට 406 කින් වර්ධනය වී තිබුණි. රේගු නිලධාරීන් වෙත ත්‍යාග ගෙවීම රු.538,030,080 කින් වැඩි වුවද, දඩමුදල් ආදායම රු.721,644,255 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

රේගු ආඥා පනතේ 153 (2) (ආ) ඡේදය ප්‍රකාරව විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 50 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කරනු ලබන අතර රේගු බදු වංචාවන් අනාවරණය කරගැනීම, පාලනය කිරීම හා වැළැක්වීම වැනි අරමුණු පෙරදැරි කරගෙන නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා මෙම අරමුදල පිහිටුවා තිබේ.

2012, 2013, 2014, 2015 හා 2016 යන වර්ෂවල දී පිළිවෙලින් රු.822,569,372 ක්, රු.1,268,050,168 ක්, රු.1,142,901,944 ක්, රු.1,214,323,918 ක් හා රු.1,814,144,851 ක් ලෙස එකතුව රු.6,261,990,253 ක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබූ අතර මින් රු.5,586,704,859 ක් හෙවත් සියයට 89.21 ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ගෙවූ මුදල රු.මිලියන 822.5 ක් පමණක් වුවද, 2016 වන විට එය රු. මිලියන 1,814.1 ක් දක්වා එනම් සියයට 120 කින් වැඩි වී තිබුණි. එසේම මෙම මුදල් ගෙවා ඇත්තේ ඒ ඒ වර්ෂවලදී විමර්ශන කටයුතු නිමවූ රේගු වැරදි කිහිපයක් සම්බන්ධයෙන් පමණක් වුවද, විමර්ශන කටයුතු නිම නොවූ සිද්ධි ප්‍රමාණය බෙහෙවින් ඉහළ අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව රේගු බදු වංචාවන්ගේ සැලකිය යුතු පාලනයක් හෝ අඩුවීමක් ත්‍යාග යෝජනා ක්‍රමය මගින් ඉටු වී ඇත්ද යන්න පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ආ) ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කරන ලද විමර්ශන කිහිපයකට අදාලව අයකළ දණ්ඩන මුදල් හා රජයේ ආදායමට බැර වූ ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| රේගු විමර්ශන අංකය | දණ්ඩන ලෙස අයකළ මුදල | දණ්ඩනවලින් රජයේ ආදායමට බැර වූ වටිනාකම | සාමාන්‍ය තත්ත්වය යටතේ අයවිය යුතුව පැවති බදු ආදායම | දණ්ඩනය මත ලැබුණ බදු මුදල හා අහිමි වූ බදු වටිනාකම අතර වෙනස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| INDS/BIU/39/2015 | 17,000,000 | 5,100,000 | 32,006,279 | 26,906,279 |
| INDS/BIU/032/2015 | 250,000 | 75,000 | 1,527,040 | 1,452,040 |
| INDS/BIU/043/2015 | 2,900,000 | 870,000 | 1,473,692 | 603,692 |
| INDS/BIU/31/2014 | 1,754,458 | 526,337 | 827,228 | 300,891 |
| එකතුව | 21,904,458 | 6,571,337 | 35,834,239 | 29,262,902 |

ඉහත කරුණු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී සාමාන්‍ය ක්‍රමයට ආනයන මත රජයට ලැබිය යුතු අවම බදු ආදායමේ ප්‍රමාණය පිළිබඳ නොසලකා රේගු වැරදි සම්බන්ධයෙන් දඩ පැනවීම හේතුවෙන් දණ්ඩන වලට යටත්වන ආනයන තුළින් රජයට ලැබිය යුතුව තිබූ ආදායමේ ප්‍රමාණය අඩු වීමක් සිදු වන අතර නිලධාරීන් වෙත බෙදා හරින ත්‍යාග මුදල්වල වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ii) රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට රැස් කරන ආදායමින් සියයට 1.485 ක ප්‍රතිශතයක් වෙන් කෙරෙන ඉන්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.67,333,645 ක් බැර කර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණු ලෙස රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම බව දක්වා තිබුණද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශීර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල එම අරමුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(iii) අරමුදල යටතේ පවතින උප අරමුදල්වන සියයට 2.5 ත්‍යාග අරමුදල හා විෂ මත්ද්‍රව්‍ය අරමුදල නමින් වූ උප අරමුදල්වල 2016 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.110,838,866 ක හා රු.79,739,956 ක ශේෂයන් පැවතියද, වසර ගණනාවක සිට එම අරමුදල්වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේ වුවද, සාධාරණ අවශ්‍යතාවන් නොසලකා දිගින් දිගටම මුදල් රැස්කර තබා ගන්නා මෙම අරමුදල් තුළ විශාල මුදලක් රැස්කර තබා ගන්නා බව නිරීක්ෂණය විය.

(iv) වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇතිවී ඇති සංකීර්ණතාවයට ගැළපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

රේගු විමර්ශනයකදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා මූලික විමර්ශන නිලධාරියාට රේගු ආඥා පනතේ 8 වන වගන්තිය මගින් නීතිමය ප්‍රතිපාදන සැලසී තිබුණි. මෙම නීතිමය ප්‍රතිපාදන මත අංක PREV/FPO/1725/2015 දරන රේගු විමර්ශන කටයුත්ත සඳහා රේගු විමර්ශන නිලධාරියා විසින් රු.මිලියන 10 ක දණ්ඩනයක් පනවා තිබූ නමුත් පසුව ලද අභියාචනයක් මත අදාල විමර්ශන නිලධාරී විසින් එම දණ්ඩන මුදල රු.මිලියන 3 දක්වා අඩු කොට තිබුණි. ඒ අනුව දණ්ඩන මුදල් ලිහිල් කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් වන අතර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරායට එවැනි නෛතික ප්‍රතිපාදන නොමැති බව නීතිපතිවරයා විසින්ද ලිඛිතව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දන්වා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ, 4.3 වගන්තිය ප්‍රකාරව අරමුදල්වල වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 06 දිනදීය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් විෂයයන් 06 කට අදාල සංඛ්‍යා, ඒවාට අදාල තත්‍ය සංඛ්‍යා සමඟ සැසඳීමේදී සියයට 20 සිට සියයට 230 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | විධිමත් පරිදි ලෙජර් ගිණුම් පද්ධතියක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබීම හා උපචිත පදනම මත ගිණුම් පිළියෙල නොකිරීම. |
| (ආ) | ත්‍යාග ගණනය කිරීම | ත්‍යාග මුදල් ගණනය කිරීමේදී රජයේ බදු ආදායම සුරක්ෂිත වන ලෙසටත්, රේගු බදු වංචාවන්වල පාලනයක් ඇති වන ලෙසටත් හා රේගු බදු වංචාවන්වල නිරත පාර්ශවයන්ට උපරිම අවාසියක් ලැබෙන ලෙසටත් වූ ප්‍රායෝගික ගණනය කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම. |
| (ඇ) | ත්‍යාග ගෙවීම් කිරීම | ගිණුම් අංශය වෙත ත්‍යාග ගොනු ලද අවස්ථාවේදී එම ගොනු ලේඛනගත කිරීම හා අනුපිළිවෙල අනුව ගෙවීම් නොකිරීම. |
| (ඇ) | අරමුදල් ඌන උපයෝජනය | සමාලෝචිත වර්ෂය තුල සියයට 2.5 ත්‍යාග අරමුදල, විෂමත්ද්‍රව්‍ය අරමුදල හා ඉන්ධන අරමුදල් යනාදී උප අරමුදල් උපයෝජනය නොකිරීම. |